*සැ. යු.–* 2007.05.11 දින පළවූ අංක 1497 දරන ගැසට් පත්‍රයේ III කොටස පළ නොකරන ලදී.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,498- 2007 මැයි 18 වැනි සිකුරාදා - 2007.05.18

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (I) වැනි ජේදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... | — |
| ආණ්ඩුවේ නිවේදන ... .. | 450 |
| මිළ පාලන දැන්වීම් .. ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් .. ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන .. ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා .. ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් .. ... | 450 |
| නාවියන්ට දැන්වීම් .. ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් .. ... | — |


(i) *සැ. යු.–* රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත 2007 අප්‍රේල් මස 20 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) ජාතික රක්ෂණ භාර අරමුදල (සංශෝධන) පනත් කෙටුම්පත 2007 අප්‍රේල් මස 20 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(iii) කම්කරු නිලධාරීන්ගේ සංගමයේ සුභසාධක අරමුදල (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2007 අප්‍රේල් මස 05 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පලකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මීන් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පලකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සැහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැලසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මීන් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක්ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2007 මැයි මස 25 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2007 මැයි මස 11 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2007 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# ආණ්ඩුවේ නිවේදන

මගේ අංකය ප්‍ර. කො. 11/2/35/23/2006/පිටු සැ.

## ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120) අධිකාරය) ආඥා පනත

01. මෙහි පහත උපලේඛනයෙහි දෙවෙනි තීරුවේ සඳහන් ඉඩම සහ තුන්වන තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමු වන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත් පිටුව නැවත සම්පූර්ණව තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥා පනතේ 4 වන වගන්තියට අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2007.05.19 වැනි දින සිට 2007.06.03 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ. ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂා කර බැලිය හැක.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් හෝ එකී විරුද්ධතාවය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2007.06.17 දිනට මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

### උපලේඛනය

| *ඉඩම් ලියාපදිංචි කළ පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ, ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ, එම්. කොට්ඨාසයේ 631 වෙළුමේ 143 දරන පත් ඉරුව | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ, රත්මලාන පිහිටි කඳවල එස්ටේට් නමැති ඉඩමට ආර්. මුරුගුපිල්ලේ මානක විසින් 1955.11.03 දින මැන සාදන ලද අංක 148 දරන පිඹුර ප්‍රකාර ලොට් බී දරන අ. 0, රූ. 0, පර්. 20ක් විශාල ඉඩම් කොටස සඳහා මායිම්,<br>උතුරට : මෙම ඉඩමේ ලොට් ඒ,<br>නැගෙනහිරට : මෙම ඉඩමේ ලොට් 155,<br>දකුණට : මෙම ඉඩමේ ලොට් 157,<br>බස්නාහිරට : ලොට් 148 (පාරක් සඳහා වෙන්කළ බිම) | (1) සී. වී. එල්. සෙනවිරත්න, ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1957.11.04 දින ලියා සහතික කරන ලද අංක 1437 දරන විකුණුම් ඔප්පුව |

එල්. කේ. රත්නසිරි,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
කොළඹ 11,
2007 අප්‍රේල් මස,

05-257

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## සීමාසහිත හැටන් නැෂනල් බැංකුව - නුවරඑළිය ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2007.03.29 දින පවත්වන ලද සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

නුවරඑළිය ප්‍රසිද්ධ නොතාරිස් ඒ. පී. කනපතිපිල්ලේ විසින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ නමට ලියා සහතික කරන ලද්දා වූ 2003.08.05 දින සහ අංක 3504 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම තලගහ ගෙදර කීර්තිසිංහ මුදියන්සේලාගේ මද්දුම බණ්ඩාර ණයකරු හැටියට ද, පැහැර හැර ඇති හෙයින් ද එකී බැඳුම්කරය යටතේ රුපියල් තුන්ලක්ෂ හැටදෙදහස් හත්සිය තිස්හයයි ශත අසූදෙක (රු. 3,62,736.82) ක මුදලක් 2006.06.30 වැනි දින වන විට සීමාසහිත හැටන් නැෂනල් බැංකුවට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 3,62,736.82ක මුදලට 2006.07.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේනම් ඒ මුදල අඩුකොට එකී අංක 3504 දරන උකස් බැඳුම්කරය මගින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව වෙත උකස් කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු එන්. එච්. පී. එන්. ආරියරත්න මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, සහ නුවරඑළිය කොට්ඨාසයේ ඔයපළාත කෝරළේ, නුවරඑළිය නගර සභා සීමාව තුළ හවා එළියේ, මහින්ද මාවතේ, නිවාස සංකීර්ණයේ, පිහිටි වැලිමඩ බලයලත් මානක පී. වික්‍රමසිංහ විසින් මැන සාදන ලද 1988 අගෝස්තු-ඔක්තෝබර් දිනැති අංක 1966 දරන පිඹුරෙහි ලොට් අංක 95 ලෙස නිරූපිත ඉඩම කොටස, උතුරට : මහින්ද මාවතෙන් ද, නැගෙනහිරට : ලොට් 9ඒ වලින් ද, දකුණට : ලොට් 93 සහ 96න් ද, බස්නාහිරට : අඩි පාරෙන් ද මායිම් වූ පර්චස් නවයයි දශම හතරක් (අ. 0, රූ. 0, පර්. 9.4) (0.0238 හෙක්ටයාර්) විශාලත්වය සහිත ඉඩම වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රාණී ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මණ්ඩලයේ ලේකම්.

05-288/1

---

## සීමාසහිත හැටන් නැෂනල් බැංකුව-බොරැල්ල ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2007.03.29 දින පවත්වන ලද සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. සී. ජයවර්ධන විසින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ නමට ලියා සහතික කරන ලද්දා වූ 2005.01.05 දින සහ අංක 2324 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ටැලන්ට් ඩී ගෲප් යන නාමය විලාශය අභිධානය යටතේ තනි පුද්ගල ව්‍යාපාරයක් පවත්වාගෙන යන දසනායක ණයකරු හැටියට ද, පැහැර හැර ඇති හෙයින් ද එකී බැඳුම්කරය යටතේ රුපියල් හාරලක්ෂ පනස්පන්දහස් අනූහතයි ශත පහ (රු. 4,55,097.05) ක මුදලක් 2007.01.26 වැනි දින වන විට සීමාසහිත හැටන් නැෂනල් බැංකුවට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 4,55,097.05ක මුදලට 2007.01.27 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේනම් ඒ මුදල අඩුකොට එකී අංක 2324 දරන උකස් බැඳුම්කරය මගින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව වෙත උකස් කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කරක ඇත්තාවූ ද දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකාරු එන්. එච්. පී. එෆ්. ආරියරත්න මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

උතුරු නැගෙනහිර පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දඹදෙණිය පත්තුවේ, උඩපොළ ඔටෝටා කෝරළේ, පොල්ගහවෙල ප්‍රාදේශීය සීමාව තුළ බන්ඩාව ගමේ පිහිටි දකුණු කොළඹ පාරේ, වරිපනම් අංක 100/9 පිහිටි වෙයුලියැද්ද කුඹුරේ පිල්ලැව නමින් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මානක ඒ. ඒ. පද්මදාස විසින් මැන සාදන ලද 2004.12.17 දිනැති අංක 3486 දරන පිඹුරේ බෙදා වෙන් කර සලකුණු කරන ලද ලොට් 1 දරන ඉඩම්, උතුරට : ප්‍රාදේශීය සභා පාරේන් ද, නැගෙනහිරට : තෙල් මෝලෙන් සහ මොහොමඩ්ගේ පරිශ්‍රයෙන් ද, දකුණට : යූ. එල්. එම්. නයිම්ට අයිති ඉඩමෙන් ද, බස්නාහිරට : පුද්ගලික පාරකින් ද මායිම් වූ එකී අංක 3486 දරන පිඹුර ප්‍රකාර පර්චස් විසිඅටයි දශම හයක් (අ. 0, රූ. 0, පර්. 28.6) විශාලත්වය සහිත ඉඩම වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රාණී ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මණ්ඩලයේ ලේකම්.

05-288/5

---

## සීමාසහිත හැටන් නැෂනල් බැංකුව-හැටන් ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2007.03.29 දින පවත්වන ලද සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් එම්. එස්. පෙරේරා විසින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ නමට ලියා සහතික කරන ලද්දා වූ 2005.12.06 දින සහ අංක 780 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම සිල්වෙස්ටර් ක්‍රිශාන් හෙවත් සිල්වෙස්ටර් සෙබස්තියන් ක්‍රිශාන්, නඩරාජා නවරත්නම් සහ ඇන්ටන් රොනල්ඩ් සෙබස්තියන් ණයකරුවන් හැටියට ද, පැහැර හැර ඇති හෙයින් ද එකී බැඳුම්කරය යටතේ රුපියල් තිස්තුන්ලක්ෂ දහසයදහස් හාරසියය (රු. 3,316,400) ක මුදලක් 2006.09.29 වැනි දින වන විට සීමාසහිත හැටන් නැෂනල් බැංකුවට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 3,316,400 ක මුදලට 2006.09.30 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේනම් ඒ මුදල අඩුකොට එකී අංක 780 දරන උකස් බැඳුම්කරය මගින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව වෙත උකස් කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කරක ඇත්තාවූ ද දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු එන්. එච්. පී. එෆ්. ආරියරත්න මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ලේකම් කොට්ඨාසයේ, ඔය පළාත කෝරළේ, නුවරඑළිය නගර සභා සීමාව තුළ

නෙස්බයි වතුයායේ, පිහිටි "නේස්බයි වත්ත" නමින් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මානක එච්. එම්. සමරනායක විසින් මැන සාදන ලද 2005.03.10 දිනැති අංක 4986 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 1 ලෙස නිරූපිත ඉඩම් කොටස (එම ඉඩම බලයලත් මානක පී. වික්‍රමසිංහ විසින් නැවත මැනුමකට අනුව සාදන ලද 1996 ජනවාරි 19 දිනැති අංක 3198 දරන පිඹුරේ ලොට් 1 දරන කොටස නැවත මැන සාදන ලද්දකි) උතුරට : පී. එම්. නඩරාජා පිල්ලේ විසින් හිමිකම් කියන නෙස්බි වතුයායෙන් ද, නැගෙනහිරට : වී. රාසයියා සහ එල්. එම්. මයිල්වාගනම් විසින් හිමිකම් කියන ඉඩමෙන් ද, දකුණට : එම්. ජෙයරාම් හිමිකම් කියන ඉඩමෙන් සහ මෙම පිඹුරේම ලොට් 2න් ද, බස්නාහිරට : එම්. ජෙයරාම් විසින් හිමිකම් කියන ඉඩමෙන් සහ මෙම පිඹුරේම ලොට් 2න් සහ 3න් ද, සහ නෙස්බී වතුයායෙන් ද, මායිම් වූ රූඩ් එකයි පර්චස් තිස්පහක් (අ. 0, රූ. 1, පර්. 35) හෝ 0.1897 හෙක්ටයාර් විශාලත්වය සහිත ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි සියළු දේත් සමග වේ. මෙම ඉඩම නුවරඑළිය ඉඩම් ලියාපදිංචි කිරිමේ කාර්යාලයේ ඒ 47/213 දරන වෙළුම සහ පත්ඉරුවේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රාණී ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මණ්ඩලයේ ලේකම්.

05-288/3

### සීමාසහිත හැටන් නැෂනල් බැංකුව-අළුත්ගම ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2007.03.29 දින පවත්වන ලද සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීමේදි මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

පානදුර ප්‍රසිද්ධ නොතාරිස් පී. වී. එන්. ඩබ්ලිව්. පෙරේරා විසින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ නමට ලියා සහතික කරන ලද්දා වූ 2004.02.17 දින සහ අංක 756 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම කරුණාකලගේ කුමාරජිත් වසන්ත සිල්වා ණයකරු හැටියට ද, පැහැර හැර ඇති හෙයින් ද එකී බැඳුම්කරය යටතේ රුපියල් දහහත්ලක්ෂ අසූනමදහස් අටසිය පනස්එකයි ශත විස්ස (රු. 1,789,851.20) ක මුදලක් 2007.01.31 වැනි දින වන විට සීමාසහිත හැටන් නැෂනල් බැංකුවට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 1,789,851.20 ක මුදලට 2007.02.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේනම් ඒ මුදල අඩුකොට එකී අංක 756 දරන උකස් බැඳුම්කරය මගින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව වෙත උකස් කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු එන්. එච්. පී. එෆ්. ආරියරත්න මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, දකුණු කළුතර තොටමුණේ, මලේවන් බැද්දේ බේරුවල ප්‍රාදේශීය සභාවේ, මලේවන් උප කාර්යාලීය සීමාව තුළ කොටපිටියේ පිහිටි "ගම්ඉමේ ඔිවිට" නමින් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මානක ඩබ්. එල්. ෆොන්සේකා විසින් මැන සාදන ලද 1998 දෙසැම්බර් මස 30 දිනැති අංක 2189 දරන පිඹුරේ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස උතුරට : අළුත්ගම සිට මතුගම දක්වා දිවෙන අධිවේගි මාර්ගයෙන් ද, නැගෙනහිරට : කළුතර දිසා අධිකරණයේ අංක 27288 දරන නඩුකරයේ අවසන් තීන්දු ප්‍රකාශයේ දැක්වෙන ඉඩමෙන් ද, දකුණට : ඩී. ඒ. ගුණතිලක විසින් හිමිකම් කියන ඉඩමෙන් ද, බස්නාහිරට : අංක 354 දරන පිඹුරේ ලොට් 4න් ද මායිම් වූ ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි සහ සියළු දේත් සමග, එකී අංක 2189 පිඹුර ප්‍රකාර පර්චස් තිස් එකයි දශම පහක් (අ. 0, රූ, 0, පර්. 31.5) විශාලත්වය ඇති ඉඩම කළුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එච් 165/255 දරන ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රාණී ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මණ්ඩලයේ ලේකම්.

05-288/2

### සීමාසහිත හැටන් නැෂනල් බැංකුව-පිළියන්දල ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2007.03.29 දින පවත්වන ලද සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීමේදි මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. සී. ජයවර්ධන විසින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ නමට ලියා සහතික කරන ලද්දා වූ 1997.05.20 දින සහ අංක 562 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ලොකු ලියනගේ ජයජීව අල්විස් යන අය උකස්කරු හැටියට ද, පැහැර හැර ඇති හෙයින් ද එකී බැඳුම්කරය යටතේ රුපියල් පස්ලක්ෂ හැටදහස් හාරසිය එකයි ශත දහහතක (රු. 5,60,401.17) ක මුදලක් 2007.01.31 වැනි දින වන විට සීමාසහිත හැටන් නැෂනල් බැංකුවට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 5,60,401.17ක මුදලට 2007.02.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේනම් ඒ මුදල අඩුකොට එකී අංක 562 දරන උකස් බැඳුම්කරය මගින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව වෙත උකස් කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කරක ඇත්තාවූ ද දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු පී. කේ. ඊ. සේනාපති මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කැස්බෑව ප්‍රාදේශීය සභාවේ, හෙඩිගම පිහිටි මිල්ලගහකනත්ත *හෙවත්* රුක්කත්තනගහවත්ත නමැති ඉඩමට බලයලත් මානක එච්. එල්. ගුණසේකර විසින් මැන සාදන ලද 1996 ජුලි 18 දිනැති අංක 6115 දරන පිඹුරෙන් බෙදා වෙන් කරනල ද ලොට් 2 ලෙස නිරූපිත ඉඩම් කොටස, උතුරට : අංක 2157 දරන පිඹුරේ ලොට් බී5න් සහ ලොට් බී3න් ඉතිරි කොටසින් ද, නැගෙනහිරට : ලොට් බී3 ඉතිරි කොටසින් සහ අංක 2157 දරන පිඹුරේ ලොට් 1න් සහ ලොට් බී 6න් ද, දකුණට : අංක 2157 දරන පිඹුරේ ලොට් බී2න් ද, බස්නාහිරට : ලොට් බී3න් ඉතිරි කොටසින් සහ එල්. ඩී. ඔබර්ට් ඇලෙක්සැන්ඩ්‍රා විසින් හිමිකම් කියන මෙම ඉඩමේම (ලොට් ඒ) කොටසකින් ද මායිම් වූ පර්චස් විස්සයි දශම අටයි අටක් (අ. 0, රූ. 0, පර්. 20.88) විශාලත්වය ඇති ඉඩම සහ ඒ තුළ ඇති ගොඩනැගිලි සහ සියළු දේත් සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රාණි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණි (නීති),
මණ්ඩලයේ ලේකම්.

05-288/4

---

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥා පනතේ (397 අධිකාරය) 21 වෙනි වගන්තිය යටතේ දැන්වීම

2007.03.12 වෙනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදි.

1. මහජන නොතාරිස් ඩබ්. ඒ. එස්. සී. මැතිව් විසින් සහතික කරන ලද 1997.07.14 දිනැති අංක 1937 දරන බැඳුම්කරය මත අයිරා ගිණුම මත මුල් මුදල හා 2005.10.31 දින තෙක් පොලිය වශයෙන් රුපියල් විසිලක්ෂ අසූදහස් නවසිය පහයි ශත අසූදෙකක (රු. 20,80,905.82) මුදලක් සමග රුපියල් හත්ලක්ෂ පනස් දහසක (රු. 7,50,000) අයිරාව මත වසරකට සියයට දාහතයි දශම පහ (17.5%) බැගින් පොලියක් සහ රජයේ බදු ඇතුලුව අනෙකුත් ගාස්තු 2005.11.01 වෙනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් එස්. රේණුකා ප්‍රනාන්දු මහත්මිය බාරේ, අංක 2/23, 7 වන හරස් පාර, පානදුර හි පදිංචි ඉරුප්පුගේ ප්‍රියන්ත කිත්සිරි ප්‍රනාන්දු මහතාගෙන් අයවියයුතුව ඇත.

2. 1997.07.14 දිනැති එකී අංක 1937 දරන බැඳුම්කරය මත අයවියයුතු එකී රුපියල් විසිලක්ෂ අසූදහස් නවසිය පහයි ශත අසූදෙකක (රු. 20,80,905.82) මුදල සමග 2005.11.01 වෙනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහතකී ආකාරයට අයවිය යුතු පොලිය ද, ලංකා බැංකු ආඥා පනතේ 26 වෙනි වගන්තිය යටතේ අයකර ගතහැකි ගාස්තු සහ මුදල් ද, අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කර ඇති දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළඹ 05, හැව්ලොක් ටවුන්, අංක 290 හි පදිංචි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන්ට එකී ලංකා බැංකු ආඥා පනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වෙනි වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥා පනතේ 21 වෙනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පල කිරීමට ලංකා බැංකුවේ පානදුර කඩවීදය ශාඛා කළමණාකරුටද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුනේ පානදුර තල්පිටි දෙබැද්දේ පානදුර සුලු නගර සභා සීමාවේ වලපොල පට්ටිය හි පිහිටි මූණමල්ගහවත්ත *හෙවත්* කැටකැලගහවත්ත නැමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එල්. ඩබ්. එල්. ද සිල්වා විසින් සාදන ලද 1973 පෙබරවාරි 11 දිනැති අංක 573 දරන පිඹුරේ විස්තර කළ ලොට් “1A” වශයෙන් සඳහන් බෙදන ලද්දාවූ නිශ්චිත ඉඩම් කැබැල්ල උතුරට : ශ්‍රී ආරියරත්නාරාම පාරද, නැගෙනහිරට : ජෝතිරත්න මාවත ද, දකුණට : එම ඉඩමේ ලොට් 2 ද, බස්නාහිරට : එම ඉඩමේ ලොට් 1B ද, මායිම්ව එකී අංක 573 දරන පිඹුර අනුව පර්චස් අටයි දශම අටක (අ. 0, රූ. 0, පර්. 8.8) බිම් ප්‍රමාණය සමග එහි පිහිටි ගහකොල වැව්ලි ගොඩනැගිලි සහ සියලු දේ වේ. මෙම ඉඩම පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ශීර්ෂ F60/114 යටතේ ලියාපදිංචි කර ඇත.

ටී. එච්. එන්. ඥාණසිරි,

ලංකා බැංකුව,
කඩවීදිය ශාඛාව,
පානදුර.

05-283